# කාරකත්වය හා සමාජ සංස්ථිතිය අතර ඝට්ටනය (හෙවනැල්ල නවකතාව ඇසුරෙනි)

*ඩබ්ලිව්.ඒ.එන්. සෙව්වන්දි* [1]

'ඒජන්සි' යන ඉංග්‍රීසි වචනයේ අර්ථය ප්‍රකාශ කිරීම පිණිස කාරකත්වය යන පදය යොදා ගැනේ. කාරකත්වය යනු කිසියම් පුද්ගලයෙක් හට ස්වාධීන ලෙස තීරණ ගැනීමට ඇති හැකියාව ලෙස අර්ථකථනය කළ හැකි ය. සමාජ සංස්ථිතිය යනු සමාජයේ සැකැස්මයි; දේශපාලන, ආර්ථික, සංස්කෘතික හා ආගමික වසයෙන් ගොඩනැගී ඇති මානව ක්‍රියාකාරිත්වය පාලනය කරන චින්තන පද්ධතියයි. සමාජ සංස්ථිතිය හා පුද්ගල කාරකත්වය අතර අතිශය සංකීර්ණ සබඳතාවක් පවතී. සමාජ විද්‍යා හා මානව ශාස්ත්‍ර අධ්‍යයන ක්ෂේත්‍රවල භාවිත වන මෙම සංකල්පද්වය සාහිත්‍ය කලා විචාරයෙහිලා ද උපයුක්ත කොටගත හැකි ය. සමාජයේ සාම්ප්‍රදායික ව පවත්වාගෙන යනු ලබන ස්වභාවිකකරණයට ලක් ව ඇති චින්තන රටා හෙවත් දෘෂ්ටිවාද පුද්ගල කාරකත්වය කෙරෙහි අවිඥානික ව ම බලපෑම් සිදු කරයි. කාරකත්වය හා සමාජ සංස්ථිතිය අතර ඝට්ටනය සිරි ගුනසිංහගේ හෙවනැල්ල නවකතාව ආශ්‍රයයෙන් අධ්‍යයනයකට ලක් කිරීම මෙම පර්යේෂණයෙන් සිදු විය. කාරකත්වය හා සමාජ සංස්ථිතිය අතර ඝට්ටනය කෙබඳු ද යන්න පර්යේෂණ ගැටලුව විය. පර්යේෂණ ක්‍රමවේදය වූයේ ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදයයි. දත්ත රැස් කිරීමේ දී ප්‍රාථමික මූලාශ්‍රය ලෙස සිරි ගුනසිංහ විසින් රචනා කරන ලද 'හෙවනැල්ල' නවකතාව භාවිත කළ අතර පුස්තකාලය හා අන්තර්ජාලය සමීක්ෂණය ඔස්සේ සෙසු දත්ත රැස් කර ගැනීමට යොමු විය. හෙවනැල්ල නවකතාවේ ජිනදාස නමැති තරුණයා කුඩා කල සිට ලොකු හාමුදුරුවෝ, ලොකු ඉස්කෝලෙ මහත්තයා වැනි සමාජයේ වැදගත් යැයි සම්මත චරිත පමණක් ඇසුරු කිරීමට යොමු කළ බැවින් සම වයසේ මිතුරන් ඇසුරු කිරීමට ඔහුට අවස්ථාව අහිමි විය. ඔහු ඇසුරු කළ වැඩිහිටියන් විසින් පෙන්වා දෙනු ලැබූ හොඳ යැයි සම්මත සමාජ සංස්ථිතික රාමුවකට අනුගත වීම හේතුවෙන් ඔහුගේ කාරකත්වය සීමා වී දැඩි මානසික ඝට්ටනයකට ලක් වන අයුරු එහි දී හඳුනාගත හැකි විය. ඊට වෙනස් සමාජ සංස්ථිතියක හැදී වැඩුණු ජිනදාසගේ මිතුරා වූ විජේපාලගේ චරිතය කාරකත්වයෙන් යුතු ස්වාධීන චරිතයක් ලෙස මෙහි නිරූපිත ය. කාරකත්වය යනු ස්වාධීන තීරණ ගැනීමට ඇති හැකියාව ලෙස අර්ථකථනය කළ ද, සමාජ සංස්ථිතිය අවිඥානික ව ම පුද්ගල කාරකත්වය සීමා කරන බව මෙහි දී පැහැදිලි විය.

***ප්‍රමුඛ පදඃ*** කාරකත්වය, ඝට්ටනය, ස්වාධීන, සමාජ සංස්ථිතිය, හෙවනැල්ල

[1] සිංහල අධ්‍යයනාංශය, රුහුණ විශ්වවිද්‍යාලය, sewwandinimesha30@gmail.com